# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

Ministry of Labour and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.

6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.

6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MFE/DEV/IR-04/27 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.04. 24 |

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක: 01/2023

**රැකියා සඳහා විදෙස්ගතව සිට නැවත මෙරටට පැමිණෙන විගමනික ශ්‍රමිකයින් සඳහා අතිරේක තීරු බදු සහන ලබා දීම**

විගමනික ශ්‍රමිකයින් එතෙර රැකියා නියුක්තිය තුළින් උපයන ලද විදේශ විනිමය නීත්‍යානුකූල මාර්ග ඔස්සේ මෙරටට ප්‍රේෂණය කිරීම දිරිගැන්වීම පිණිස, ඔවුන් නැවත මෙරටට පැමිණෙන අවස්ථාවන්හිදී, ගුවන්තොටුපල තීරු බදු රහිත සාප්පු සංකීර්ණයෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා විදේශගත වී සිටි කාලසීමාව පදනම් කරගෙන දැනට දෙනු ලබන තීරු බදු දීමනාවට අමතරව ඔවුන් එවන විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රමාණය මත පදනම්ව අතිරේක තීරු බදු දීමනාවක් ලබාදීමට 2022.08.08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගනු ලැබූ තීරණය ක්‍රියාත්මක කිරීම පිණිස මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

**02. කොන්දේසි/ නිර්නායක**

2.1 මෙම අතිරේක තීරු බදු සහනය ලබාදීම සඳහා සලකා බලනුයේ එතෙර සේවා නියුක්තියෙන් උපයා මෙරට බැංකු පද්ධතිය හරහා ප්‍රතිලාභියාගේ ඒක පුද්ගල හෝ බද්ධ රුපියල් ගිණුමකට පමණක් ප්‍රේෂණය කරන ලද විදේශ මුදල් ප්‍රමාණය වේ. ඒ අනුව, අදාල වාණිජ බැංකුව විසින් මෙහි 3.1හි සඳහන් යෙදවුමට අදාල දත්ත පද්ධතියට ලබාදෙනුයේ ප්‍රතිලාභියාගේ ප්‍රේෂණවල රුපියල් අගය වේ. ඉන්පසුව යෙදවුම හරහා එම රුපියල් අගය ඩොලර් සමානුපාතිකයක් ලෙස වාර්තා කෙරෙන අතර එහිදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල දිනය සඳහා ප්‍රකාශ කරන ලද මධ්‍ය විනිමය අනුපාතිකය (TT Middle Exchange Rate) භාවිතා කර එ.ජ.ඩොලර් වලට පරිවර්තනය කරනු ඇත. කෙසේවෙතත් මෙම සහනය ලබාදීම පිණිස ශ්‍රමිකයා විසින් විදේශ මුදල් ගිණුමකට හෝ කවුන්ටරයෙන් මුදල් ලෙස ලබාගැනීම සඳහා හෝ එවන ලද ප්‍රේෂණ සලකා බලනු නොලැබේ.

2.2 මෙම අතිරේක තීරු බදු සහනය ලැබීමට 2022.05.01 දිනෙන් පසුව එවන ලද ප්‍රේෂණ ප්‍රමාණය සලකා බලනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය යටතේ එක් වරක් තීරු බදු සහනය ලබාගත් ශ්‍රමිකයෙකුට නැවත වරක් එම සහනය ලබාගත හැකි වනුයේ මාස 12 ක සීමාවකින් පසුවයි. ඒ අනුව මෙම අතිරේක තීරු බදු සහනය ලබාගැනීමට අදාලව මුල් වරට කරනු ලබන ඉල්ලීමක් සඳහා 2022.05.01 දිනෙන් පසුව ඉල්ලීම් කරන දිනය දක්වා රුපියල් ගිණුම් වලට එවා තිබෙන ප්‍රේෂණ ප්‍රමාණය ආසන්න එක් වසරක උපරිමයකට යටත්ව සැලකිල්ලට ගනු ලැබේ.


ලේකම්/செயலாளர்/Secretary : +94 112 368164 කාර්යාලය/அலுவலகம்/Office : +94 112 581991 ෆැක්ස්/தொலைநகல்/Fax : +94 112 582938/+94 112 368165

විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : slmol@slt.lk / secretary@labourmin.gov.lk වෙබ් අඩවිය/இணையத் தளம்/Web site: www.labourmin.gov.lk

2.3 අතිරේක තීරු බදු සහනය සඳහා සුදුසුකම් ලැබීමට මෙරටට පැමිණීමට පෙර වසරක් හෝ ඊට අඩු කාලසීමාවක් තුළ අවම වශයෙන් එ.ජ.ඩොලර් 2400 ක් ප්‍රේෂණය කර තිබිය යුතු අතර, එම කාල සීමාව තුල රුපියල් ගිණුම් වලට ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණය මත අතිරේක තීරු බදු සහනය පහත වගුවේ දක්වා ඇති පරිදි කාණ්ඩ 5ක් යටතේ ලබා දේ.

2.3.1 වගුව - රුපියල් ගිණුම් වලට ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණය මත හිමිවන අතිරේක තීරු බදු සහනය

| දැනට පවත්නා දීමනාව | | යෝජිත අතිරේක තීරු බදු දීමනාව | | |
|---|---|---|---|---|
| අඛණ්ඩව විදේශගතව වී සිටි කාලය | නිදහස් තීරු බදු දීමනාව (එ.ජ. ඩොලර්) | තීරු බදු නිදහස් දීමනාවේ කාණ්ඩය | සලකා බලන කාලසීමාව තුළ රුපියල් ගිණුමකට ප්‍රේෂණය කළ යුතු අවම එ.ජ.ඩොලර් හෝ සමාන විදේශ විනිමය ප්‍රමාණය | ඉල්ලුම් කළ හැකි අතිරේක තීරු බදු දීමනාව (එ.ජ.ඩොලර්) |
| දින 90කට අඩු | 187.5 | Silver | 2,400-4,799 | 600 |
| දින 90-365ත් අතර | 625.0 | Silver-Plus | 4,800-7,199 | 960 |
| දින 365ට වැඩි | | Gold | 7,200-11,999 | 1,440 |
| | 1,750.00 | Gold-Plus | 12,000 – 23,999 | 2,400 |
| | | Platinum | 24,000 හෝ ඊට වැඩි | 4,800 |

**03. මෙහෙයුම් ක්‍රමවේදය**

3.1 මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වනුයේ LankaPay (Pvt)) Ltd ආයතනය විසින් අවශ්‍ය පරිදි සංවර්ධනය කරන ලද LankaRemit යෙදවුමේ දත්ත පදනමක් හරහාය. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ පාර්ශවකරුවන් වන වාණිජ බැංකු මෙන්ම ශ්‍රී ලංකා රේගුව වෙත අවශ්‍ය අතුරු මුහුණත් (Interface) LankaPay (Pvt)) Ltd ආයතනය විසින් ලබාදෙනු ඇත.

3.2 LankaRemit යෙදවුම තුළින් සෘජුවම මෙම තීරු බදු සහනය ඉල්ලුම් කල හැකිය. සුහුරු (Smart) ජංගම දුරකථනයක් භාවිතා කරන විගමනික ශ්‍රී ලාංකිකයෙකුට LankaRemit යෙදවුම තම ජංගම දුරකථනයේ ස්ථාපනය කර ගෙන ඒ තුළින් අතිරේක තීරු බදු සහනය පිළිබඳ දැන ගැනීම සඳහා තමා මෙරටට පැමිණීමට මත්තෙන් යෙදවුමෙහි සපයා ඇති පහසුකම හරහා ඉල්ලීමක් තමා මුදල් ප්‍රේෂණය කරන ලද බැංකුවට / බැංකුවලට ඉදිරිපත් කළ හැකිය. එම ඉල්ලීම අවම වශයෙන් බැංකුවල වැඩකරන ව්‍යාපාරික පැය 48කට (ආසන්න වශයෙන් වැඩකරන දින 06ක්) පෙර ඉදිරිපත් කල යුතුය. එවිට ඉල්ලීම ඉදිරිපත් කළ තැනැත්තාට යෙදවුම (APP) හරහා මෙම තීරු බදු සහනයට අදාල තොරතුරු පෙන්නුම් කරන අතර, අදාල තොරතුරු ශ්‍රී ලංකා රේගුව වෙතද සම්ප්‍රේෂණය වේ.

3.3 සුහුරු (Smart) ජංගම දුරකථනයක් භාවිතා නොකරන අයෙකු එම ඉල්ලීම ලිපියක ආකාරයෙන් හෝ ඊ-මේල් පණිවිඩයක ආකාරයෙන් මෙහි ඇමුණුම 01හි දැක්වෙන ආකෘතියට අනුව පමණක් අදාල බැංකුව/ බැංකුවලට ඉදිරිපත් කළ යුතුය. බැංකුව විසින් එවැනි ඉල්ලීමකට අදාල තොරතුරු ලබා දී ඇති අතුරු මුහුණත (Interface) හරහා LankaPay (Pvt)) Ltd ආයතනය විසින් සංවර්ධනය කල දත්ත පදනමට ඇතුලත් කළ යුතුය.

ඊට අමතරව, ඉල්ලීම ලද බැංකුව විසින් විගමනික ශ්‍රමිකයා ඉල්ලා සිටි සියලු තොරතුරු ඇතුලත්වන තහවුරුවක් ලිපි ශීර්ෂයේ, බලයලත් නිලධාරියෙකුගේ අත්සනින් යුතුව දෘඩ පිටපතක් හෝ නොඑසේනම් මෘදු පිටපතක් ලෙස විගමනික ශ්‍රමිකයාට හෝ ඉල්ලීම සිදුකරන ලද ඔහු සමඟ බද්ධ ගිණුමේ හවුල්කාර පාර්ශවය වෙත ලබා දිය යුතුය. බැංකුව විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත මෙම තොරතුරු ලබාදීමට භාවිතා කල යුතු මෙහි ඇතුලත් ඇමුණුම 02 ආකෘතියම මේ සඳහා ද භාවිතා කළ හැකිවේ.

3.4 මෙම අතිරේක තීරුබදු සහනය ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපලක පිහිටි තීරු බදු නිදහස් සාප්පුවකින් මිලදී ගන්නා භාණ්ඩ සඳහා පමණක් අදාල වේ.

## 4. වෙනත්

4.1 මෙම යෝජනා ක්‍රමයේ ඉලක්කගත සෘජු ප්‍රතිලාභීන් වනුයේ විධිමත් මාර්ග හරහා මෙරටට ප්‍රේෂණ එවනු ලබන විගමනික ශ්‍රමිකයින් වුව ද, ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින සහ සලකා බලන කාලය තුළ එ.ජ.ඩොලර් 2,400කට වැඩි වටිනාකමක් සහිත විදේශ මුදල් ප්‍රමාණයක් මෙරට රුපියල් ගිණුමකට ප්‍රේෂණය කරන ද්විත්ව පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකිකයෙකු ද මෙම අතිරේක තීරු බදු රහිත දීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

4.2 ප්‍රතිලාභය ලබා ගන්නා දිනට පෙර ශ්‍රමිකයා විදේශගතව සිටි කාලය සහ ප්‍රතිලාභය ලබා ගන්නා දිනට ප්‍රේෂණය කර, රුපියල්වලට පරිවර්තනය කරන ලද මුදල් ප්‍රමාණය පිළිබඳව LankaPay

(Pvt)) Ltd ආයතනය විසින් ලබාදෙනු ලබන අතුරු මුහුනතෙහි (Interface) තොරතුරු මත පදනම්ව, ශ්‍රී ලංකා රේගු නිලධාරීන් විසින් එක් එක් ශ්‍රමිකයා සුදුසුකම්ලත් තීරු බදු රහිත දීමනාව ඉහත අංක 2.3.1 යටතේ දක්වා ඇති වගුව අනුව තීරණය කරනු ඇත.

4.3 මෙම තීරු බදු සහනය ගුවන්තොටුපලක පිහිටි තීරු බදු සාප්පු සංකීර්ණයකින් මිලදී ගන්නා භාණ්ඩ සඳහා පමණක් අදාල වන අතර, විදේශයකදී මිලදී ගෙන ගමන් බඩු කාර්යාලයක් හරහා සුදුසුකම් ලබන භාණ්ඩ එවා ඇති මහීන්ට විදේශගතවී සිටි කාලය පදනම්ව දැනට ලැබෙන බදු නිදහස් දීමනාව ඒ සඳහා යොදා ගැනීමේ අවස්ථාව නොවෙනස්ව පවතී.

4.4 මෙම චක්‍රලේඛය මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟතාවය මත නිකුත් කෙරේ. චක්‍රලේඛය පිළිබඳ කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2368137 ඔස්සේ මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රතිපත්ති) ඇමතිය හැකිවේ.

4.5 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීමේ දිනය 2023 මැයි 01 දින වේ.

ආර්.පී.ඒ. විමලවීර
ලේකම්

පිටපත්-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය